EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමුපකාර සමිතියකි.

සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල පවතින මතු සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා සමිතියේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් සහ බාහිර අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත සඳහන් පොදු කොන්දේසිවලට අදාළව සකසන ලද අයදුම්පත්‍ර 2026.03.14 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතුය.

(යාපනය, මන්නාරම දිස්ත්‍රික් හැර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරයන්හි සමිතියේ දිස්ත්‍රික් කාර්යාල පවතී.)

මේ සඳහා කුසලතා පූර්ණ, උද්යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## සහකාර ගණකාධිකාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

01. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ / මූල්‍ය කළමනාකරණය / ගණකාධිකරණය යන ක්ෂේත්‍රයේ උපාධිය සමග ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද.

හෝ

02. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ වසර 04 ක ඩිප්ලෝමා පාඨමාලාව සමග ගිණුම්කරණ / වාණිජ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුද්ද.

හෝ

03. වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ දෙවන අදියර සමත්වීම සමග පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

හෝ

04. ගණකාධිකරණ ශිල්පී ආයතනයේ (AAT) තුන්වන අදියර සමත්වීම සමග පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

හෝ

05. ඉහත 1, 2, 3 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමග බඳවා ගනු ලබන සමුපකාර සමිතියේ / සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 07 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

**වැටුප් පරිමාණය :** මාසික 48,400 - 720 X 10

**පොදු කොන්දේසි**

- ඉහත සඳහන් තනතුරට අදාළ මාසික වැටුපට අමතරව රු. 17,800/- ක ජීවන වියදම් දීමනාවද, රජය විසින් අනුමත රු. 11,000/- දීමනාවද හිමි වනු ඇත.
- අයදුම්කරුවන් ජීව දත්ත සහ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත්ව තමා විසින්ම සකස් කරගත් දත්ත පත්‍රිකාවක් සමග ලබා දී ඇති අයදුම්පත්‍ර ආකෘතියද සම්පූර්ණ කර ඉල්ලුම් කළ යුතුය.
- අයදුම්කරුවන්ගේ ජීවදත්ත පත්‍රිකාව සමග අයදුම්කරුවන් තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතිකවල ඡායා පිටපත් ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද එවිය යුතුය. (අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර විය යුතුය)
- වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අයකු අයදුම්පත් එවීමේදී අදාළ සමිතිය මගින් ඉදිරිපත් කළ යුතු අතර, වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අතරතුර සෘජුව අයදුම්පත් එවා ඇති බව් ඔහු / ඇය තෝරා ගත් පසුව වුවද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වනු ඇත.
- සමිතියේ ඕනෑම දිස්ත්‍රික් / ශාඛා කාර්යාලයක සේවය කිරීමට කැමති විය යුතු අතර, තෝරා ගැනීමෙන් පසු පුරප්පාඩු පවතින කාර්යාල වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අනුයුක්ත කිරීම සිදු කරන බැවින් ඒ සඳහා එකඟ විය යුතුය.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**ප්‍රධාන සභාපති,**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**
**දුරකථන අංකය : 011-2266000**